# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය / எனது இல / My No: DSD/HO/08/PM/04/E.Power-2025

ඔබේ අංකය / உமது இல / Your No: ..........................................

දිනය / திகதி / Date: 2025.04.02

දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරු,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කළමනාකාරුවන්.

**<u>ප්‍රජා සවිබලගැන්වීම් වැඩසටහන - 2025</u>**
**<u>ක්ෂේත්‍රගත සමෘද්ධි නිලධාරීන් කලාප / ප්‍රගති රැස්වීම් හා සාකච්ඡා සඳහා කැඳවීම.</u>**

අස්වැසුම සමාජ ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් හා සමෘද්ධි සහනාධාර ලැබූ (දැනට අස්වැසුම සමාජ ප්‍රතිලාභ නොලබන) අඩු ආදායම්ලාභී ප්‍රතිලාභී පවුල් 400,000 ක් සවිබලගැන්වීම සම්බන්ධව ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් පවුල් හඳුනා ගැනීම හා සවිබලගැන්වීමට අදාල කටයුතු වෙනුවෙන් උපදෙස් ලබා දී ඇත.

**02.** ඒ අනුව, ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් මෙම කාර්යය දැනට සිදුවිමෙන් පවතී. ග්‍රාම නිළධාරි වසම් වල සේවක පුරප්පාඩු පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල සමෘද්ධි සංවර්ධන නිලධාරීන් තම රාජකාරි නියුතු නිත්‍ය ග්‍රාම නිලධාරී වසමට අමතරව, ග්‍රාම නිලධාරී වසමක හෝ වසම් කිහිපයක වැඩ ආවරණය කරන අවස්ථා ද ඇත.එබැවින් මෙම නිළධාරින්ගේ රාජකාරි කටයුතු බහුල වි ඇත.

**03.**එබැවින්, *සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට තම සවිබලගැන්විම් රාජකාරි කටයුතු සිදු කිරිම හා ඉලක්ක ගත දිනවල අවසන් කිරිමට අවස්ථාව දිය යුතුය.* එබැවින්,මෙම කාර්යයට රාජකාරියේ මුල්තැන ලබා දීම සිදු කළ යුතුය. සමෘද්ධි බැංකු, සමෘද්ධි බැංකු සමිති හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නිතර නිතරම රැස්විම්/ සාකච්ඡා සඳහා ක්ෂේත්‍ර ගත *සමෘද්ධි සංවර්ධන* නිළධාරින් කැඳවිම් නොකරන ලෙස ඉල්ලමි.

**04.**නමුත්, කලාප රැස්විම් හා ප්‍රගති රැස්විම් පැවැත්විම හා නිළධාරින් කැඳවිම දී ඇති උපදෙස් අනුව සුපුරුදු පරිදී සිදු කල යුතුය.

**05.** *සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින්* ක්ෂේත්‍ර මුදල් රැස්කිරිම් ආපසු භාර දීම සඳහා සමෘද්ධි බැංකුවට පැමිණිම ගිවිසුම් ගත දිනවල පමනක් සිදුවිය යුතුය. තවද, අදාල කාර්යය නිමවිමෙන් අනතුරුව ක්ෂේත්‍රය රාජකාරි වෙනුවෙන් පිටත් ව යැමට ඉඩදිය යුතුය.

**06.** මීට අමතරව, අනිකුත් රාජකාරී දින වල ද සමෘද්ධි බැංකුවට කැඳවන බවට තොරතුරු ලැබි ඇත. එසේ නොකරන ලෙස සමෘද්ධි කළමනාකරුවන්ට මෙමඟින් දන්වමි.

**07.** නිළධාරින්ට දැනුම් දියයුතු තොරතුරු, බැංකු කලාප කළමනාකරු මඟින් හෝ තාක්ෂණික සංනිවේදන ක්‍රමවේද හරහා නිළධාරින් වෙත ලබාදිමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙසත් ඉල්ලමි.

**08.** මෙම උපදෙස් අනුව කටයුතු කර, සවිබලගැන්විම් වැඩසටහන සාර්ථක කරගැනිමට සහාය දෙන ලෙසද ඉල්ලමි.

**සී.ඩී කළුආරච්චි**
**අධ්‍යක්ෂ ජනරාල්**


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |